# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,854 - 2014 මාර්තු මස 14 වැනි සිකුරාදා - 2014.03.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 192 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 192 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 192 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 193 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 අප්‍රේල් මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 මාර්තු මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

191– B 080820—300 (2014/03)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2014 අංක 191

MOD/DEF/03/02/RET/48.

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

නිත්‍ය නාවික බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2012 දෙසැම්බර් මස 10 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

කොමාණ්ඩර් (නාසෙ) ජයවීර ආරච්චිගේ ජයන්ත කුමාර පෙරේරා, ශ්‍රීලංනාහ - එන්ආර්පී 0741

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

03-362

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2014 අංක 192

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I පන්තියේ එල්. චන්ද්‍රපාල මහතා 2013 දෙසැම්බර් මස 12 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

03-330/1

2014 අංක 193

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I පන්තියේ එස්. ඒ. අනුර සතුරුසිංහ මහතා 2013 නොවැම්බර් මස 12 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන සංරක්ෂක ජනරාල් වශයෙන්.

03-330/2

# රජයේ නිවේදන

**දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය**

ලංකා දුම්රිය සේවක යහසාධක සංගමය

**විශේෂ නිළවරණය පැවැත්වීම**

ලංකා දුම්රිය සේවක යහසාධක සංගමයේ විශේෂ නිළවරණය 2014.01.12 දින දෙමටගොඩ දුම්රිය ධාවනබල ක්‍රීඩා සාමාජයීය දේශන ශාලාවේ දී පවත්වන ලදී

2. එහිදී 2014 සහ 2015 වර්ෂ සඳහා සංගමයේ ඉදිරි කටයුතු කිරීමට සාමාජික ඡන්දයෙන් තෝරාපත් කර ගන්නා ලද නිලධාරී මණ්ඩලය පහත සඳහන් පරිදි වන බව නිවේදනය කරමි.

සභාපති - කේ. ඩී. ප්‍රියලත් මහතා,
උප සභාපති - එච්. ටී. එල්. කාලිදාස මහතා
භාණ්ඩාගාරික/ලේකම් - ඩී. පී. කේ. සිල්වා මහතා,
කාරක සභිකයින් - 01 පී. ඒ. ආර්. ප්‍රනාන්දු මහතා
13. එම්. ටී. කුරේ මහතා,
14. එස්. ඩී. එල්. සෝමරත්න මහතා,
15. කේ. ජයන්ත මහතා,
16. එම්. ඒ. ආර්. ශාන්ත කුමාර මහතා,
17. එම්. ජී. එන්. තුෂාර මහතා,
18. එච්. පී. නිශාන්ත මහතා,
19. එල්. එච්. ටී. සිල්වා මහතා,
20. එල්. ජී. පී. ජයරත්න මහතා,
21. කේ. ඩබ්. ඒ. එස්. ඒ. පෙරේරා මහතා,
22. ටී. එම්. නිශාන්ත මහතා
23. පී. සී. ජයතිස්ස මහතා

බී. ඒ. පී. ආරියරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

03-328

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීම

2013.12.12 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කිතුල්ගොඩ විසින් සහතික කරන ලද 2011.01.13 දිනැති අංක 2517 දරන උකස් බැඳුම්කරය අනුව 2013.10.22 දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් තුන්කෝටි දොලොස් ලක්ෂ හැටහත් දහස් නවසිය දහයයි ශත හැත්තෑ එකක (රු. 31,267,910.71) මුදල සමග රුපියල් දෙකෝටි හතලිස් ලක්ෂයක (රු. 2,40,00,000) මුදල මත වසරකට සියයට විසිඑකයි දශම පහ (21.5%) බැගින් පොළියක් 2013.10.23 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් හල්තොට, කන්නන්තුඩාව අංක 62/A හි පදිංචි කහවලගේ උපුල් පෙරේරා යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කිතුල්ගොඩ විසින් සහතික කරන ලද 2011.01.13 දිනැති එකී අංක 2517 දරන උකස් බැඳුම්කරය අනුව අයවිය යුතු රුපියල් තුන්කෝටි දොලොස් ලක්ෂ හැටහත් දහස් නවසිය දහයයි ශත හැත්තෑ එකක (රු. 31,267,910.71) මුදල සමග 2013.10.23 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් පාරේ, අංක 290හි වෙන්දේසි භාර ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන් හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එම සංශෝධන වල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ හොරණ ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු හට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවේ, හොරණ දකුණ අංක 615A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හොරණ නගර සභා සීමාව තුළ හොරණ පිහිටි වැවේහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ඒ. පී. ජයසූරිය විසින් සාදන ලද 2010 ඔක්තෝබර් මස 01 වැනි දිනැති අංක 5391 දරන පිඹුරෙහි ලොට් 2L ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2L උතුරට : එකී අංක 5391 දරන පිඹුරෙහි නිරූපිත එම ඉඩමේ ලොට් 2J සහ ලොට් 2K (මීටර් 4.5 පළල පාරට වෙන් කළ කොටස ද) ද, නැගෙනහිරට : ලොට් E ද, දකුණට : ලොට් G ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු වයි. බී. කේ. කොස්තා විසින් සාදන ලද 1982.01.19 දිනැති අංක 1525 දරන පිඹුරෙහි නිරූපිත එම ඉඩමේ ලොට් 1 ද මායිම්ව රූඩ් දෙකයි පර්චස් විසිදෙකයි දශම අටක (අ. 0, රූ. 2, පර්. 22.8) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි හයයි බින්දුවයි බින්දුවයි එකක බිම් ප්‍රමාණයකින් සමන්විත වන අතර එහි ඇති ගහකොළ හා ගොඩනැගිලි මෙන්ම වෙනත් සියලු දේ සමග වේ.

ඒ සමගම මෙයට එකී හොරණ පිහිටි වැවේහේන නමැති ඉඩමෙහි අංක 5391 දරන පිඹුරෙහි ලොට් 2K ලෙස දක්වා ඇති සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති උතුරට : පානදුර සිට රත්නපුර දක්වා වූ ප්‍රධාන පාර සහ ලොට් D ද, නැගෙනහිරට : ලොට් D සහ E ද, දකුණට : ලොට් 2L ද, බස්නාහිරට : ලොට් 2J, 2H, 2F (මීටර් 3.05 පළල පාර) 2E, 2C, 2B සහ 2A ද මායිම්ව එකී අංක 5391 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිතුනයි දශම නවයක (අ. 0, රූ. 0, පර්. 23.9) හෙවත් හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි හයයි බින්දුවයි හතරයි හයක (හෙක්. 0.06046) බිම් ප්‍රමාණයකින් සමන්විත බෙදූ ඉඩම් කැබැල්ල මතින් පාරේ අයිතිය ද ඇත.

එකී හොරණ පිහිටි වැවේහේන නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු වයි. බී. කේ. කොස්තා විසින් සාදන ලද 1982 ජනවාරි 19 වැනි දිනැති අංක 1525 දරන පිඹුරේ ලොට් 2 ලෙස දක්වා නිරූපණය කර ඇති එකී ලොට් 2L සහ 2K යන බෙදූ ඉඩම් කැබලි එනම් එකී ලොට් 2, උතුරට : රත්නපුර සිට පානදුර දක්වා වූ ප්‍රධාන පාර සහ ලොට් D ද, නැගෙනහිරට : ලොට් D සහ E ද, දකුණට : ලොට් G ද, බස්නාහිරට : ලොට් 1 ද මායිම්ව එකී අංක 1525 දරන පිඹුර ප්‍රකාර අක්කර එකයි රූඩ් එකයි පර්චස් දහසයයි දශම දෙකක (අ. 1, රූ. 1, පර්. 16.2) හෙවත් හෙක්ටයාර් බින්දුවයි දශම පහයි හතරයි හයයි අටයි තුනක (හෙක්. 0.54683) බිම් ප්‍රමාණයකින් සමන්විත වන අතර මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C325/144හි ලියාපදිංචි කර ඇත.

ඉහත ලොට් 2 ලෙස දක්වා ඇති එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු බී. ඒ. පී. ජයසූරිය විසින් මෑතකදී සාදන ලද මැනුම් පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී හොරණ පිහිටි වැවේහේන නමැති ඉඩමේ, එහි ඇති ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද ඇතුළත් අංක 5382 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2, උතුරට : රත්නපුර සිට පානදුර දක්වා වූ පාර ද, නැගෙනහිරට : ලොට් D හා E ද, දකුණට : ලොට G ද, බස්නාහිරට : අංක 1525 දරන පිඹුරෙහි ලොට් 1 ද මායිම් ව එකී අංක 5382 දරන පිඹුර ප්‍රකාර අක්කර එකයි රූඩ් එකයි පර්චස් දහයයි දශම පහක (අ. 1, රූ. 1, පර්. 10.5) හෙවත් හෙක්ටයාර් බින්දුවයි දශම පහයි තුනයි දෙකයි හතරයි එකක (හෙක්. 0.53241) බිම් ප්‍රමාණයකින් සමන්විත වේ.

එකී ලොට් 2 ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කිතුල්ගොඩ විසින් සහතික කරන ලද 2011.01.13 දිනැති අංක 2517 දරන උකස් බැඳුම්කරය මත උකස් කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. කන්නන්ගර මයා,
කළමනාකරු.

2014 ජනවාරි මස 23 වැනි දින,
ලංකා බැංකුව,
හොරණ.

03-309

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීම

2013.12.12 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. ඩබ්. තිලකරත්න විසින් සහතික කරන ලද 2009.03.12 දිනැති අංක 976 දරන උකස් බැඳුම්කරය අනුව 2013.09.13 දින තෙක් පළමු ණය මත මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් පනස් හයලක්ෂ තිස් දහස් අටසිය හැට හතයි ශත පනස් හතරක (රු. 56,30,867.54) මුදල සමග රුපියල් තිස්නව ලක්ෂ දහසය දහස් හයසිය හතළිස් පහක (රු. 39,16,645) මුදල මත 2013.09.14 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය දක්වා වසරකට සියයට දහතුනයි දශම බින්දුව (13.0%) බැගින් පොළිය ද 2 වැනි ණය මුදල මත මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් හැටහය ලක්ෂ හැට දෙදහස් අටසිය විසිඅටයි ශත හැට එකක (රු. 66,62,828.61) මුදල සමග රුපියල් හතළිස් හතර ලක්ෂ අනූදහස් තුන්සිය අසූ පහයි ශත හතක (රු. 4490,385.07) මුදලක් මත 2013.09.14 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් වසරකට සියයට දහතුනයි දශම බින්දුව (13.0%) බැගින් තවදුරටත් පොළිය ද කැම්බල් පෙදෙසෙහි දෙහිවල කැම්බල් පෙදෙසෙහි අංක 37හි පිහිටි ද රිට්ස් ටුවරිස්ට් ගෙස්ට් හවුස් ඇන්ඩ් රෙස්ට්ටුරන්ට් හි හවුල්කරුවන් වන වත්තල, එඬේරමුල්ල, සිළුමිණ මාවතෙහි අංක 166හි පදිංචි රත්නායක මුදියන්සේලාගේ පර්සි සනත් නිහාල් රත්නායක මහතා සහ කැකුල්තොටුවගේ දෝන ශාන්ති කමනියා ග්‍රේස් වික්‍රමරත්න මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. ඩබ්. තිලකරත්න විසින් සහතික කරන ලද 2009.03.12 දිනැති එකී අංක 976 දරන උකස් බැඳුම්කරය අනුව පළමු ණය මුදල මත අයවිය යුතු රුපියල් පන්කෝටි හය ලක්ෂ තිස් දහස් අටසිය හැට හතයි ශත පස් හතරක (රු. 56,30,867.54) මුදල සමග දෙවන ණය මුදල මත අයවිය යුතු රුපියල් හයකෝටි හයලක්ෂ හැට දෙදහස් අටසිය විසි අටයි ශත හැට එකක (රු. 66,62,828.16) මුදල සමග 2013.09.14 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අය කර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවතේ, අංක 50/3හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එකී සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ වැල්ලවත්ත අධිශ්‍රේණි ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු හට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල, ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි අංක 540A දරන දෙහිවල බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ සල්පිටි කෝරළේ, පල්ලෙ පත්තුවේ, දෙහිවල පිහිටි කැම්බල් පෙදෙසෙහි වරිපනම් අංක 37 දරන අලුත්වත්ත නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ඒ. එෆ්. සමීර් විසින් සාදන ලද 1978 සැප්තැම්බර් මස 30 දිනැති අංක 2066 දරන පිඹුරෙහි ලොට් X3 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් X3 උතුරට : කැම්බල් පෙදෙස ද, නැගෙනහිරට : ලොට් X2 ද, දකුණට : දෙවන පටුමග සහ ලොට් 11BA 14A ද, බස්නාහිරට : දුම්රිය මාර්ග ද මායිම්ව එකී අංක 2066 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහසයයි දශම අටයි පහක බිම් ප්‍රමාණයකින් සමන්විත වන අතර මෙය දෙල්කඳ-නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි දෙහි 100/110හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජේ. ඥානසම්බන්දන්,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

2014 ජනවාරි මස 23 වැනි දින,
ලංකා බැංකුව,
වැල්ලවත්ත,

03-310

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

එම්. අයි. එම්. රසීම්.
ගිණුම් අංක : 1033 5099 8597/0033 5002 1751.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ක් වූ ජනවාරි මස 30 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත්

බැංකුව පීඑල්සී නමින් රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් කේ. එල්. එම්. ඩී. කිත්සිරි යන අය විසින් ලියා සහතික කරන ලද 2008 පෙබරවාරි මස 14 දාතම හා අංක 286 දරන සහ 2010 ජනවාරි 13 දාතම හා අංක 695 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මොහමඩ් ස්මයිල් මොහමඩ් රසීම් යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 286 සහ 695 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පනස් හතර ලක්ෂ අනූ එක් දහස් පන්සිය දෙකයි ශත අසූ හතරක (රු. 54,91,502.84) මුදලක් 2014 ජනවාරි මස 13 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් පනස් හතර ලක්ෂ අනූ එක් දහස් පන්සිය දෙකයි ශත අසූ හතරක (රු. 54,91,502.84) මුදල ද, 2013 ජනවාරි මස 14 දින සිට අංක 286 සහ 695 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතලිස් ලක්ෂ හැට නම දහස් හයසිය නමයයි ශත හතලිස් පහක (රු. 40,69,609.45) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහඅටක් (18%) හා තවත් රුපියල් අටලක්ෂ හැත්තෑ එක් දහස් පන්සීයයක (රු. 8,71,500) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 286 සහ 695 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ, දකුණු උඩ පත්තුවේ රත්නපුර මහ නගර සභා සීමාවන් තුළ රත්නපුර පිහිටි වෝර්ඩ් වරකාතොට මුස්ලිම් පල්ලිය පටුමග වරිපනම් අංක 26 දරන "සන්නාසිගේගොඩැල්ල'' යැයි කියනු ලබන ඉඩමට (බලයලත් මානක තැන ඊ. ඒ. බූපධීර යන අය විසින් සාදන ලද 2004 මැයි මස 01 දාතම හා දරන සත්‍ය පිටපතක් වශයෙන් සහතික කළ) බලයලත් මානක තැන එල්. යූ. කන්නන්ගර යන අය විසින් සාදන ලද 1993 නොවැම්බර් මස 29 දාතම හා අංක 4208 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 02 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කළු අප්පු යන අයට අයිති ඉඩම, අඩි පාර සහ උඩවත්ත, නැගෙනහිරට : මුස්ලිම් පල්ලිය පටුමග, දකුණට : සන්නාසිගොඩැල්ලගේ කොටස සහ බස්නාහිරට : පල්ලියකුඹුර සහ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසිහතයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 27.50) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 4208 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව A800/233 යටතේ රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

03-339/1

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

පී. ජී. සී. ඩී. කරුණාරත්න.
ගිණුම් අංක : 1020 5399 4091.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ක් වූ ජනවාරි මස 30 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් කේ. එල්. එම්. ඩී. කිත්සිරි යන අය විසින් ලියා සහතික කරන ලද 2012 පෙබරවාරි මස 28 දාතම හා අංක 1195 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පැපිලියවෙල ගමරාලලාගේ චමින්ද දිනූෂ කරුණාරත්න යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 1195 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පනස් දෙලක්ෂ අසූ එක්දහස් තිස් හයයි ශත එකක (රු. 52,82,036.01) මුදලක් 2013 දෙසැම්බර් මස 23 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් පනස් දෙලක්ෂ අසූ එක්දහස් තිස් හයයි ශත එකක (රු. 52,82,036.01) මුදල ද 2013 දෙසැම්බර් මස 24 දින සිට අංක 1195 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතලිස් අට ලක්ෂ තිස් දෙදහස් එකසිය දහ හතරයි ශත හැට එකක (රු. 48,32,114.61) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනක් (13%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1195 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ, කෝරළේ තුනේ පල්ලේ පත්තුවේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මුරුතංගල ග්‍රාමයේ පිහිටි "නරියමුල්ලහේන" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. කේ. එස්. බමුණුසිංහ යන අය විසින් සාදන ලද 2011 ජනවාරි මස 10 දාතම හා අංක 1659 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 09 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 10, නැගෙනහිරට : ලොට් ආර්1, දකුණට : ලොට් 7 සහ 8 සහ බස්නාහිරට : ලොට් 7 සහ ඇන්ටනි පෙරේරාගේ මෙම ඉඩමෙන් කොටසක් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම එකයි හතරක් (අ. 0, රූ. 0, පර්. 10.14) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි

සෑම සියළු දේත් සමග එකී අංක 1659 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව V203/257 යටතේ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ, යටින් ඒ මතින් ගමන් කිරීමේ හා අයිතිය සහ වෙනත් අයිතීන් ද සමග ය.

බලයලත් මානක තැන බී. කේ. එස්. බමුණුසිංහ යන අය විසින් සාදන ලද 2011 ජනවාරි මස 10 දාතම හා අංක 1659 දරන පිඹුරේ නිරූපිත ලොට් R1, R2, R3, D1, සහ D2 වශයෙන් ලකුණු කරන ලද ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පිළිවෙලින් වෙළුම/පත්‍රිරුව V206/108, V206/107, V206/109, V206/110 සහ V206/111 යටතේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

03-339/2

---

**කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පීඑල්සී (ලියාපදිංචි අංක පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංක : 643406,
සුරතුර එන්ටටේන්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

2013 පෙබරවාරි මස 27 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඕ. ආර්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 2005 අප්‍රේල් මස 11 වැනි දින අංක 8774 දරන කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ්, දැන් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමින් වූ බැඳුම්කරය යටතේ සුරතුර එන්ටටේන්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් බන්ධනදායි වශයෙන් හා අංක V. C. 329 අම්පිටිය, මහනුවර යන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන චන්ද්‍රන සකුරා කරාගොඩ පතිරණ සහ මුදියාන්සේ ස්වර්ණමාලී පතිරණ යන අය උකස්කරුවන් වශයෙන් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හතලිස් පන්ලක්ෂ හැත්තෑ අටදහස් නවසිය අසූ හතයි ශත තිස් හතක් (රු. 45,78,987.37) මුදලක් 2013.01.03 වැනි දින වන විට කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හතලිස් පන්ලක්ෂ හැත්තෑ අටදහස් නවසිය අසූහතයි ශත තිස්හත (රු. 45,78,987.37) ක මුදල හා 2013.01.04 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 41,54,600ක මුදලක් සඳහා වාර්ෂිකව 22% බැගින් වූ පොලිය ද ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවාද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එයද අඩු කර අය කර ගැනීම සඳහා එකී අංක 8774 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර, මාවිල්මඩ, ලේවැල්ල පාර, දුටුගැමුණු මාවතේ, අංක 369/1 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

**උපලේඛනය**

(1) මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අම්පිටිය උඩගම මහනුවර උතුර ගන්දහය කෝරළේ සහ ගඟවට කෝරළේ පිහිටි ගෙදරවත්ත කොටසක් ඇතුළත්ව සමන්විත කපුකනත්තේහේන, දොරකඩකුඹුර කපුකනත්තේවත්ත සහ කඩවත්තේවත්ත දැන් එක් ඉඩමක් ලෙස සැදුණු ඉඩමට බලයලත් මානක කේ. වීරපන විසින් 1996.02.26 වැනි දින සාදන ලද අංක 776 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 02 නමැති ඉඩමට මායිම්, එනම්, උතුරට : ඉහත අංක 776 දරන පිඹුරේ ලොට් 1න් ද, උතුරු-නැගෙනහිරට : මහනුවර තලාතුඔය මහා මාර්ගයෙන් ද, දකුණ සහ දකුණු-නැගෙනහිරට : ඉහත කී පිඹුරේ සඳහන් ලොට් 3 වෙන් කරන ඇලෙන් ද හා බස්නාහිරට : ඉහත කී අංක 776 දරන පිඹුරේ නිරූපිත ලොට් 1න් ද යන මෙකී මායිම් තුළ පිහිටි වරිපනම් අංක 329/1 දරන ගොඩනැගිල්ල ඇතුළු අනිකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් තිහක් (අ. 0, රූ. 0, පර්. 30) (හෙක්ටයාර් 0.07588).

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව G365/77හි ලියාපදිංචි කර ඇත.

(2) මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අම්පිටිය උඩගම මහනුවර උතුරු ගන්දහය කෝරළේ සහ ගඟවට කෝරළේ පිහිටි ගෙදරවත්ත කොටසක් ඇතුළත්ව සමන්විත කපුකනත්තේහේන, දොරකඩකුඹුර කපුකනත්තේවත්ත සහ කඩවත්තේවත්ත දැන් එක් ඉඩමක් ලෙස සැදුණු ඉඩමට බලයලත් මානක කේ. වීරපන විසින් 1996.02.26 වැනි දින සාදන ලද අංක 776 දරන පිඹුරේ නිරූපිත ලොට් 3ට මායිම් එනම්, උතුරට : ඉහත කී පිඹුරු අංක 776හි නිරූපිත ලොට් 2 වෙන කරන ලද ඇලෙන් ද, නැගෙනහිරට : මහනුවර තලාතුඔය මහා මාර්ගයෙන් ද, දකුණ සහ දකුණු-නැගෙනහිරට : බලයලත් මානක රංජිත් විජේසුන්දර විසින් සාදන ලද පිඹුරු අංක 661 නිරූපිත ලොට් 1 සහ ලොට් 2 උඩගමවෙලේ අමරතුංරාළගේ කුඹුරෙන් ද සහ බස්නාහිරට : යාපා යන අය විසින් හිමිකම් කියන ලද කුඹුරෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් විසි පහයි (අ. 0, රූ. 0, පර්. 25) (හෙක්ටයාර් 0.06323)

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව G365/78හි ලියාපදිංචි කර ඇත.

(3) මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය උඩගම දකුණ අම්පිටිය අංක 270 ග්‍රාම නිලධාරී කොට්ඨාසය උඩගම අම්පිටිය පිහිටි ගෙදරවත්ත කොටසක් ඇතුළත්ව සමන්විත කපුකනත්තේහේන දොරකඩ කුඹුර කපුකනත්තේ වත්ත සහ කඩවත්තේ වත්ත නමැති ඉඩමට බලයලත් මානක ජේ. ටී. ඩේවිඩ් විසින් 1952.01.04 වැනි දින සාදන ලද පිඹුරු අංක 3680 දරන පිඹුරේ නිරූපිත ලොට් 3 සහ ලොට් 4හි කොටසක් ඇතුළත්ව කේ. වීරපන විසින් 1996.02.26 වැනි දින සාදන ලද පිඹුරු අංක 776හි නිරූපිත ලොට් 2 සහ ලොට් 3 ගෙදරවත්ත කොටසක් ඇතුළත්ව සමන්විත කපුකනත්තේහේන දොරකඩකුඹුර කපුකනත්තේවත්ත සහ කඩවත්තේවත්ත දැන් එක් ඉඩමක් ලෙසින් වරිපනම් අංක 329/1 දරන පරිශ්‍රය මැනකදී කරන ලද මැනුමක් අනුව බලයලත් මානක බී. පී. රූපසිංහ විසින් 2005.01.31 වැනි දින සාදන ලද අංක 3270 පිඹුරේ නිරූපිත ලොට් 1 දරන ඉඩම් කොටස විස්තර වී

ඇත්තේ එනම්, උතුරට : බලයලත් මානක කේ. වීරපන විසින් සාදන ලද අංක 776 පිඹුරේ ලොට් 1න් ද, නැගෙනහිරට : මහනුවර තලාතුඔය මහා මාර්ගයෙන් ද, දකුණට : බලයලත් මානක රංජිත් විජේසුන්දර විසින් සාදන ලද අංක 661හි නිරූපිත ලොට් 2 දරන උඩගමවෙලේ අමරතුංරාළගේ කුඹුරෙන් ද සහ බස්නාහිරට : යාපා යන අය විසින් හිමිකම් කියන ලද කුඹුරෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි වරිපනම් අංක 329/1 දරන ගොඩනැගිල්ල ඇතුළු අනෙකුත් සියළු දේ. ඉඩම් ප්‍රමාණය රූඩ් එකයි පර්චස් පහළොවක් (අ. 0, රූ. 01, පර්. 15) විශාල ඉඩම.

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍ර‍ිරුව G416/121 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

ආර්. ආර්. දුනුවිල මිය.,
සමාගම් ලේකම්.

03-368